# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2022
2024 දෙසැම්බර්/ 2025 ජනවාරි

සමාජීය විද්‍යා පීඨය

## ජනසන්නිවේදනය
(නව නිර්දේශය)

**භාෂාව හා නිර්මාණාත්මක සන්නිවේදනය MACO 28214**

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

1. "මානව භාෂාව නිර්මාණාත්මක සංකේත පද්ධතියකි." නිර්වචන ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 20)
2. "මානවයා විසින් මෙතෙක් බිහිකළ හොඳම නිර්මාණය භාෂාවයි." භාෂාව නිර්මාණය කිරීම නිසා මානව ඉතිහාසයේ සිදු වූ වෙනස්කම් පිළිබඳ විවරණය කරන්න. (ලකුණු 20)
3. "යම් සංස්කෘතියක් පිළිබඳ හැදෑරීමේ දී එම සංස්කෘතියට අයත් භාෂාව අධ්‍යයනය කිරීම වැදගත් වේ." සාකච්ඡා කරන්න. (ලකුණු 20)
4. "සමාජ ගැටලු පිළිබඳ විවරණ නිර්මාණශීලීව සංවාදයට බඳුන් කිරීම තීරු ලිපි රචකයාගේ කාර්යභාරයයි." තෝරාගත් තීරු ලිපි රචකයින් දෙදෙනෙකුගේ රචනා ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 20)
5. "නිර්මාණශීලි ලේඛනය, අත්දැකීම්, පරිකල්පනය හා භාෂාවේ ශක්‍යතා මත පදනම් වෙයි." නිර්මාණකරුවා හා නිර්මාණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 20)
6. "ජනශ්‍රැතික චින්තනය නවමු ආකාරයේ මාධ්‍ය සංදේශ සඳහා උපයෝගී වේ." නිදසුන් සහිතව විමසන්න. (ලකුණු 20)
7. "ගුවන් විදුලි ශ්‍රාවක මනස තුළ චිත්තරූප මැවිය හැක්කේ නිර්මාණාත්මක භාෂාවකට පමණි." ගුවන් විදුලි භාෂාවේ විශේෂතා පිළිබඳ අවධානය යොමු කරමින් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 20)
8. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් (02) පිළිබඳ සටහන් ලියන්න. (2×10 = ලකුණු 20)
   - i. ජනවහර හා ගීත නිර්මාණ
   - ii. කැමරා රූප රාමු
   - iii. කතා කීමේ කලාවේ මූලිකාංග
   - iv. ශ්‍රව්‍ය දෘශ්‍ය සංස්කරණ ශිල්පීය ක්‍රම
   - v. තිර රචනයක මූලිකාංග
   - vi. සාමූහික නිර්මාණයක් ලෙස සංගීත සංරචනාව

************************************************